# ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ එහි සෞඛ්‍යමය බලපෑම



**DR (MRS) N. MAPITIGAMA**

**CONSULTANT COMMUNITY PHYSICIAN**

**PROGRAMME MANAGER FOR GENDER AND WOMEN'S HEALTH**

**FAMILY HEALTH BUREAU**

**MINISTRY OF HEALTH**

# ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සෞඛ්‍යමය ගැටළුවක්ද?

- ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මුළු ලොවටම පොදුවූ ප්‍රශ්නයකි.
- එය විවිධ සංස්කෘතික, සමාජීය, භූගෝලීය, ආගමික හා ආර්ථික ස්ථර පුරා පැතිරී ඇත.
- මානව හිමිකම් පිළිබඳ ගැටළුවකි.
- මහජන සෞඛ්‍යය පිළිබඳ විශාල ප්‍රශ්නයක් බව හඳුනාගෙන ඇත.



# ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ලොව පුරා ප්‍රචලිත බවට සාක්ෂි



# ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සැගවුණු, ලෝකය පුරා ප්‍රචලිත සෞඛ්‍යමය ගැටළුවකි.

- ඇමෙරිකා එක්සත් ජනපදයේ, සෑම වසරකදිම මිලියන 2.4 ක් කාන්තාවන් හිංසනයට හා පහරදීමට ලක් වන අතර, ප්‍රජනක වයසෙහි සිටින කාන්තාවන් වැඩි වශයෙන්ම අනතුරු වලට ලක්වන හේතුවද මෙයවේ.
- ඇමෙරිකා එක්සත් ජනපදයේ 28% ක් හා එංගලන්තයේ 25% ක් කාන්තාවන් (තම ජීවිත කාලය තුල) එක් වතාවක් හෝ තම සහකරුගෙන් හිංසනයට ලක් වී ඇත. (UNICEF 2000)
- එංගලන්තයේ වසරක් පාසා කාන්තාවන් 10 කගෙන් එක් අයෙක් බරපතල ලෙස තම පුරුෂයාගෙන් හිංසනයට හා පහර කෑමට ලක් වන අතර, ඇමෙරිකා එක්සත් ජනපදයේ සෑම තත්පර 15 කට වරක් කාන්තාවක් තම සහකරුගේ පහරදීම් වලට ලක් වේ. (Epstein 1998)

# ලෝක සෞඛ්‍යය සංවිධානය මගින් අන්තර්ජාතිකව සිදු කරන ලද සමීක්ෂණය


24000 ක් කාන්තාවන් සහභාගි කරවා ගන්නා ලද අතර පහත සඳහන් රටවල් 10 යේ සහභාගිත්වයෙන් සිදු කරන ලදි.

- බංගලාදේශය
- බ්‍රසීලය
- ඉතියෝපියාව
- ජපානය
- පේරු රාජ්‍යය
- නැම්බියාව
- සැමෝවා රාජ්‍යය
- සර්බියාව
- තායිලන්තය
- ටැන්සානියාව


# මෙම අධ්‍යයනයේ අරමුණු

- සහකරු මගින් සිදුවන හිංසනයෙන් කාන්තාවන් ආරක්ෂා කරවන්නාවු කරුණු හා වඩ වඩාත් හිංසනයට ලක් වීමට හේතුවන කරුණු හදුනා ගැනිම.
- ශාරිරික, ලිංගික හා මානසික හිංසනයෙහි ව්‍යාප්තිය නිර්නය කිරිම. මෙහිදි සහකරු මගින් සිදුවන හිංසනය කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත.
- සහකරු මගින් සිදුවන හිංසනය හේතුවෙන් මතුවන සෞඛ්‍යමය ගැටළු අධ්‍යයනය කිරිම.

# සහකරු මගින් සිදුවන්නා වූ ශාරිරික/ලිංගික හිංසනයේ ප්‍රවනතාවය (WHO, 2004)




# සහකරු මගින් තදබල ශාරීරික හිංසනයන් ඇති වීමේ ප්‍රවනතාවය (WHO, 2004)



# අයහපත් සෞඛ්‍යය තත්වයන් වාර්තා කරන්නාවු කාන්තාවන් ප්‍රතිශතය හා ශාරීරික හිංසනය වාර්තා කරණ කාන්තාවන් අතර ඇති සම්බන්ධතාවය

***Proportion of women reporting poor health and association with reported violence***



# හිංසනය සෞඛ්‍ය ගැටළු ඇති කරන්නාවූ අවදානම් සහගත කරුණකි

- අපයෝජනයට ලක් නොවූ කාන්තාවන් හා සැසඳීමේදී ඊට ගොදුරු වූ කාන්තාවන් පහත ලක්ෂණ පෙන්නුම් කරයි

  - වඩාත් වැඩි රෝග ලක්ෂණ

  - ක්‍රියාකාරීත්වයේ දුබලතාවයන් (අඩාල වීම් හා හීන වීම්)

  - වඩා අභයපත් සෞඛ්‍ය තත්වයන්


  - සෞඛ්‍යය සේවාවන් වැඩි වශයෙන් භාවිතා කිරීම

  - විවිධාකාරවූ රෝග තත්වයන් හඳුනා ගැනීම


- අපයෝජනයෙහි බරපතල බව රෝග ලක්ෂණයන්හි බරපතල බවින් පිළිඹිබු කරයි.

# ශාරිරික හිංසනය හා සිය දිවි හානිකර ගැනීමේ අදහස අතර ඇති සම්බන්ධතාවය

## *Violence and suicidal ideation*



# ශාරීරික හිංසනය හා ගබ්සාවන් ඇති වීමේ ප්‍රවනතාවය අතර ඇති සම්බන්ධතාවය



# හිංසනය නිසා ගර්භණීභාවය මත ඇති වන අහිතකර බලපෑම්



1. යෝනි මාර්ගය හා ගැබ් ගෙල ආශ්‍රිත ආසාදනයන්
2. නොමේරූ දරූ උපත් (Pre mature Labour)
3. ගබ්සාවීම්
4. මළ දරූ උපත්
5. ගර්භණී අවධියේ ඇතිවන රුධිර වහනය වීම්
6. අඩු බර උපත් (Low birth weight)
7. පූර්ව ගර්භණී හා ගර්භණී සෞඛ්‍යය සේවාවන් (මාතෘ සෞඛ්‍යය සේවාවන්) නියමිත කලට ලබා නොගැනීම.

# හිංසනය නිසා වෙනත් නාරිවේදී ගැටළු ඇතිවේ


ලිංගික හිංසනයට ලක්වු විට පහත ලක්ෂණ පෙන්නුම් කරයි

- යෝනි මාර්ගයෙන් රුධිරය වහනය වීම
- යෝනි මාර්ගයෙන් ශ්‍රාවයන් පිට වීම
- මාස් ශුද්ධියේදි අධික වේදනාව
- ලිංගික ක්‍රියාකාරිත්වය වෙනස් වීම (අඩපණ වීම, බෙලහින වීම)
- ප්‍රජනක පද්ධතිය ආශ්‍රිත රෝග තත්ව (PID)
- උදරය/යටි බඩෙහි ඇතිවන දිර්ඝකාලින වේදනාව


# ඉහත සමීක්ෂණයට අනුව

- ලෝකය පුරා සෑම කාන්තාවන් තිදෙනෙකුගෙන් එක් අයෙක්, තම සහකරු අතින් පහර කෑමට, ලිංගික අපයෝජනයට ලක්වේ.
- ශාරීරික හා ලිංගික අපයෝජනය, කාන්තාවන්ගේ සෞඛ්‍යය තත්වයේ පිරිහිමට හා ශාරීරික දුබලතා(බෙලහීනතාවයන්) සදහා ප්‍රධාන සාධකයක්වේ

# හිංසනය, ශාරීරික දුබලතාවයන්ට හා මරණයට ප්‍රධාන සාධකයකි



# සහකරුගෙන් සිදුවන හිංසනය සහකාරියගේ ජීවිතය විනාශ කිරීමට සාධකයක් විය හැක.






# ශ්‍රී ලංකාවේ කරන ලද අධ්‍යයනයන්ට අනුව හිංසනයේ වර්තමාන තත්වය



# ශ්‍රී ලංකාවේ කරන ලද අධ්‍යයනයන්ට අනුව හිංසනයේ වර්තමාන තත්වය

කාන්තාවන්ට අත්විදින්නට සිදු වන හිංසනයන් සෑම ප්‍රදේශයකින්ම, සෑම සමාජ ස්ථරයකින්ම හා සියලු ජාතින්ට අයත් පුද්ගලයින් අතරින් වාර්තා වේ.

- හිංසනයට ලක් වන්නාවු බොහෝ ස්ත්‍රින් වයස අවු. 20-44 අතර වේ.
- එම හිංසනයන් සිදු කරන්නේ ස්වාමියා, නෑදෑයින්, අසල්වාසින් හා වෙනත් සමීපතමයන් විසිනි.

# 2006 වර්ෂයේදි කරණ ලද සමීක්ෂණයක්

- බස්නාහිර පලාතේ කාන්තාවන් තම සහකරුගෙන් හිංසනයට ලක් වීමේ ප්‍රවනතාවය
- වයස 18 - 49 ත් අතර විවාහක කාන්තාවන්
- 750 ක සාම්පලයක්
- ලෝක සෞඛ්‍ය සංවිධානයේ සමීක්ෂණය සඳහා යොදා ගන්නා ලද ප්‍රශ්ණාවලියම (WHO questionnaire) යොදා ගන්නා ලදි.

# සමීක්ෂණ ප්‍රතිඵල

- තම ජීවිත කාලය තුළදී ශාරීරිකව හිංසනයට ලක් වීමේ ප්‍රවණතාවය 34.4% ක් වේ.
- පසු ගිය වසර තුළදී ශාරීරිකව හිංසනයට ලක් වීමේ ප්‍රවණතාවය 8.8% ක් වේ.
- තම ජීවිත කාලය තුළදී ඉතාම බරපතල ලෙස ශාරීරිකව හිංසනයට ලක් වීමට ඇති ප්‍රවණතාවය 19.8% ක් වේ.

# ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නිසා ඇතිවන සෞඛ්‍යමය ගැටළු

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය

### මාරාන්තික ප්‍රතිඵල

- මිනී මැරීම
- සියදිවි නසා ගැනීම
- මාතෘ මරණ
- AIDS ආසාදන හා ආශ්‍රිත ප්‍රශ්ණ

### මාරාන්තික නොවන ප්‍රතිඵල

**මානසික**

- PTSD
- විශාදය Depression
- සාංකාව Anxiety
- බිය Phobia /Panic disorders

**ප්‍රජනක සෞඛ්‍ය පිළිබද ගැටළු**

- අනවශ්‍ය ගැබ් ගැනීම්
- HIV /AIDS /STI
- නාරිවේදිය ගැටලු
  (යෝනි මාර්ගයෙන් රුධිරය වහනය වීම, යෝනි මාර්ගයෙන් දුගද ඇති ශ්‍රාවයන් පිට වීම, ඔසප් කාලයේදි ඇති වන වේදනාවන්, ලිංගික බෙලහීනත්වය, ශ්‍රෝනියේ වේදනාවන්)
- අනාරක්ෂිත ගබ්සාවන්
  ගර්භනී අවධියේ සංකූලතා/LBW
- PID

**දිගුකාලීනව පවතින සෞඛ්‍ය ගැටලු**

- Chronic pain
- ආන්ත්‍රික ආබාධ
- Fibromialgia
- මතක ශක්තිය දුර්වල වීම හා මතකය වෙනස් වීම

**ශාරීරික**

- තුවාල ( සිරීම්/ භග්න/----)
- අභ්‍යන්තර ඉන්ද්‍රියන්ට හානිවීම
- ස්ථිර ආබාධිත තත්වයන්
- තම සෞඛ්‍ය පිරිහීම
- එදිනෙදා කටයුතු කරගැනීමට අපහසු වීම
- කරකැවිල්ල

**ශාරීරික සෞඛ්‍යයට හානිකර පුරුදු/ ඇබ්බැහිවීම්**

- දුම් පානය මත්පැන් /මත් ද්‍රව්‍ය භාවිතය
- අනාරක්ෂිත ලිංගික හැසිරීම
- මානසික පීඩනය නිසා කය නොවෙහෙසීම (Physical inactivity)
- ආහාර ගැනීමේ අසාමාන්‍යතා

# මැදිහත් වීම

බහු ආයතනික පිවිසුමක්

අවශ්‍යයයි.

# සෞඛ්‍ය සේවකයින්ගේ වගකීම්





# ස්තුතියි